# මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යාංශය
# நிதி மற்றும் வெகுசன ஊடக அமைச்சு
# MINISTRY OF FINANCE AND MASS MEDIA

මහලේකම් කාර්යාලය, කොළඹ 01. ශ්‍රී ලංකාව
செயலகம், கொழும்பு 01. இலங்கை
The Secretariat, Colombo 01. Sri Lanka

කාර්යාලය / அலுவலகம் / Office - මුදල් / நிதி / Finance: (+94)-11-2484500, (+94)-11-2484600, (+94)-11-2484700
ෆැක්ස් / பெக்ஸ் / Fax - මුදල් / நிதி / Finance: (+94)-11-2449823
කාර්යාලය / அலுவலகம் / Office - ජනමාධ්‍ය / வெகுசன ஊடக / Mass Media: (+94)-11-2513459, (+94)-11-2513498, (+94)-11-2512324
ෆැක්ස් / பெக்ஸ் / Fax - ජනමාධ්‍ය / வெகுசன ஊடக / Mass Media: (+94)-11-2513458
වෙබ් අඩවි / வெப் சைட்கள் / Websites: www.treasury.gov.lk, www.media.gov.lk


මගේ අංකය / எனது இல. / My No.: එම්.එස්.ඩී./චක්‍රලේඛ / 2017
ඔබේ අංකය / உமது இல. / Your No.:
දිනය / திகதி / Date: 2017.10.25

කළමනාකරණ සේවා චක්‍රලේඛ : 05/2017

අමාත්‍යාංශ ලේකම්වරුන්
රාජ්‍ය සංස්ථා, ව්‍යවස්ථාපිත මණ්ඩල සහ
සම්පූර්ණයෙන් රජය සතු සමාගම්වල සභාපතිවරුන් වෙත,

**රාජ්‍ය සංස්ථා, ව්‍යවස්ථාපිත මණ්ඩල සහ සම්පූර්ණයෙන් රජය සතු සමාගම්වල ජ්‍යෙෂ්ඨ මට්ටමේ නිලධාරීන් සඳහා වෘත්තීය දීමනාවක් ලබා දීම**

රාජ්‍ය සංස්ථා. ව්‍යවස්ථාපිත මණ්ඩල සහ සම්පූර්ණයෙන් රජය සතු සමාගම්වල ජ්‍යෙෂ්ඨ මට්ටමේ නිලධාරීන් සඳහා 2017.08.15 දින පැවැති අමාත්‍ය මණ්ඩල රැස්වීමේ දී, පහත සඳහන් (02) ඡේදයේ කොන්දේසිවලට යටත්ව වෘත්තීය දීමනාවක් 2017.10.01 දින සිට ක්‍රියාත්මක වන පරිදි ගෙවීමට තීරණය කර ඇත.

01. ගෙවිය යුතු මාසික වෘත්තීය දීමනාව

| කාණ්ඩය | මාසික දීමනාව (රු.) |
|---|---|
| වසර 06 කට අඩු සක්‍රීය සේවා කාලයක් සහිත නිලධරයන් | රු. 3000/- |
| වසර 06 ක් හෝ එයට වැඩි සහ වසර 11 ට අඩු සක්‍රීය සේවා කාලයක් සහිත නිලධරයන් | රු. 5000/- |
| වසර 11 ක් හෝ එයට වැඩි සහ වසර 19 ට අඩු සක්‍රීය සේවා කාලයක් සහිත නිලධරයන් | රු. 10000/- |
| වසර 19 ක් හෝ එයට වැඩි සක්‍රීය සේවා කාලයක් සහිත නිලධරයන් | රු. 15000/- |

02. ඉහත දීමනාව ගෙවීමට අදාළ කොන්දේසි

I. මෙම දීමනාව කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 02/2016 හි උපලේඛන III හි දැක්වෙන සේවක වර්ගීකරණයෙහි ජ්‍යෙෂ්ඨ මට්ටමට අයත්වන තනතුරු සඳහා පමණක් අදාළ කර ගත යුතුය.

II. මෙම දීමනාව ගෙවිය යුත්තේ කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 02/2016 යටතේ වැටුප් ගෙවනු ලබන ආයතනවල අදාළ කාර්ය මණ්ඩල සඳහා පමණක් විය යුතුය.

III. මෙම දීමනාව සඳහා හිමිකම් ලබනුයේ, ඉහත චක්‍රලේඛයේ සඳහන් අයුරින්, දැනට ලබන වැටුපට අතිරේකව ගෙවනු ලබන ගැලපුම් දීමනාව සහ ජීවන වියදම් දීමනාවට අමතරව භාෂා ප්‍රවීණතා දීමනා, ප්‍රවාහන දීමනා, අවදානම් දීමනා සහ දුරකථන දීමනාව හැර, වෙනත් කිසිදු විශේෂ දීමනාවක් නොලබන නිලධරයන් පමණි.

IV. ජ්‍යෙෂ්ඨ මට්ටමේ සේවා කාලය ගණනය කිරීමේදී, නිලධරයෙකු එම ආයතනයේ ජ්‍යෙෂ්ඨ මට්ටමේ තනතුරක සේවය කළ සක්‍රීය සේවා කාලය පමණක් අදාළ කර ගත යුතුය.

ආර්. එච්. එස්. සමරතුංග
භාණ්ඩාගාරයේ ලේකම් සහ
මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යාංශයේ ලේකම්

පිටපත් :-

1. ජනාධිපති ලේකම්
2. අග්‍රාමාත්‍ය ලේකම්
3. අමාත්‍ය මණ්ඩල ලේකම්
4. විගණකාධිපති
5. ලේකම්, ජාතික වැටුප් හා සේවක සංඛ්‍යා කොමිෂන් සභාව